**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව - 2019**
**---------------------------------------------------**

**1.1 ව්‍යාචනය කළ මතය**
**---------------------**

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 ව්‍යාචනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී

පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ ස්කන්ධ ශේෂය යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉකුත් වර්ෂයට අදාල ශේෂය රු.31,383,715 ක් ලෙසද ඊට අනුරූපී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.9,192,893 ක් ලෙස ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේ වුවත්, ඉකුත් වර්ෂයේ ආරම්භක ශේෂයට සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු රු.36,108,501 ක ගැලපීම් පිළිබඳ විස්තර ඇතුළත් ජර්නල් වවුචර් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර එම ගැලපීම් වලට අදාළ විස්තර සැසඳුම් ප්‍රකාශයක් මඟින් හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ලබාදුන් උපදෙස් පරිදි ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | ලෙජර් ගිණුම් වල දැක්වෙන අවසන් ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වලට සටහන් කළ යුතු අතර ඒ සඳහා ගැලපීම් සිදුකර තිබේනම් අදාල විස්තර ඇතුලත් සැසඳුම් ප්‍රකාශයක් මගින් හෝ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පියවා නොතිබූ එහෙත් 2020 වර්ෂයේ පියවා තිබුණු එකතුව රු.102,100 ක් වූ අත්තිකාරම් ශේෂ 04 ක් සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් පියවීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එකී ලැබිය යුතු අත්තිකාරම් ශේෂය මූල්‍ය ප්‍රකාශන වලින් පෙන්නුම් කර නොතිබුණි. | මින් ඉදිරියට වර්ෂය අවසානයට පියවා නොතිබූ ශේෂ අත්තිකාරම් ගිණුමේ පෙන්වනු ඇත. | පියවා නොතිබූ ශේෂ අත්තිකාරම් ගිණුමේ නොපියවූ අත්තිකරම් ලෙස දැක්විය යුතුවීම. |

## 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>(රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | හිමිකම් ප්‍රාග්ධනය | 33,747,436 | ලෙජර ගිණුම් | මින් ඉදිරියට ලෙජර් ගිණුම් අනුව වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කරනු ලැබේ. | කොමිසමේ සියලුම ගනුදෙනු ලෙජරය ඇතුලු මූලික පොත්වල සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රඳවා ගත් ඉපයීම් | 36,998,200 | ලෙජර ගිණුම් | මින් ඉදිරියට ලෙජර් ගිණුම් අනුව වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කරනු ලැබේ. | කොමිසමේ සියලුම ගනුදෙනු ලෙජරය ඇතුලු මූලික පොත්වල සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ස්ථාවර තැන්පත් | 5,398,776 | ස්ථාවර තැන්පත් ලේඛනය | ස්ථාවර තැන්පත් වල Certificate අප ලඟ ඇත. මින් ඉදිරියට ඔබ දැක් වූ පරිදි ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ | ස්ථාවර තැන්පත්වල විස්තර, වාර්ෂික පොළිය, කල්පිරෙන දිනට තැන්පතුවේ වටිනාකම ඇතුලත් කර ස්ථාවර තැන්පත් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) | අවස්ථා 09 ක දී ලබා දී තිබූ රු.173,569 ක් වූ අත්තිකාරම් මුදල් පියවීම දින 07 සිට දින 53 දක්වා කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි. | අදාල නිලධාරින් හට මේ පිළිබඳ ප්‍රායෝගික ගැටළු මතු වී ඇති බවට සභාපති හට දැන්වූ අතර, මින් ඉදිරියට ප්‍රමාදයන් නොකරන ලෙස ඔහු විසින් අවවාද කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් ලබාදුන් කාර්යය අවසන් වූ විගස පියවීම් කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානයන්ගෙන් බැහැරව කොමිෂන් සභාවේ සේවකයන් වෙනුවෙන් 2015 වර්ෂයේදී පෞද්ගලික රක්ෂණ ක්‍රමයක් ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා සේවකයන් 56 දෙනෙකු | මිල කැඳවීම් කිහිපයක් ගෙන ඉන් ලාභදායි සමාගම කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇත. මුළු මුදලින් 50% ක් ආයතනය මගින් දරනු ලැබේ. | මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තියේ විධිවිධාන පරිදි කටයුතු කල යුතුවීම. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 05 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | වාහන වල ඉන්ධන පරීක්ෂාව චක්‍රලේඛ අනුව ඉදිරියට කරනු ලැබේ. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවීම. |

**1.7 මුදල් කළමනාකරණය**

------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් ලංකා බැංකුවේ අළුත්කඩේ ශාඛාවේ පවත්වාගෙන යනු ලබන බැංකු ජංගම ගිණුමේ 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 හි පැවති ශේෂයෙහි සාමාන්‍ය රු. 19,067,226 ක් විය. මෙම කාලපරිච්ඡේදය පුරාම රු. මිලියන 11 ත් 24 ත් අතර මුදලක් කාර්යක්ෂම උපයෝජනයකින් තොරව පැවති අතර මෙම මුදල් ඵලදායි ලෙස ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් කලින් වර්ෂ වලින් ඉතිරි වීමෙන් පවති. බොහෝ අවස්ථා වල අමාත්‍යාංශයෙන් අපට මුදල් නිසි වෙලාවට නොලැබෙන හෙයින් මෙම මුදල් භාවිතා කරනු ලැබේ. එහෙයින් මෙම මුදල අපට ආයෝජනය කිරිමට අපහසුය. | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ඇමතුම් තැන්පතු (Call deposit) වල හෝ ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.35,418,539 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 13,838,669 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 21,579,870 පිරිහීමක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 27 දරන නීති ආධාර කොමිෂන් සභා පනතේ, 4(එ) ඡේදයේ සඳහන් නීති ආධාර සැපයීමෙහි ලා වූ යම් අංශයක් සම්බන්ධයෙන් පර්යේෂණාත්මක වැඩ සටහන්, නීති ගැටළු මධ්‍යස්ථාන හා ව්‍යාපෘති පිහිටු වීම පාලනය කිරීම, සංවර්ධනය කිරීම හා ඒවාට සහයෝගය දැක්වීම හා ඒ කාර්ය සඳහා වැඩ සටහන් හා ව්‍යාපෘති ඇති කිරීම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීම යන ප්‍රධාන බලතල මෙතෙක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | පනතේ සඳහන් කාර්යන් ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |
| (ආ) | රාජ්‍ය නීති ආධාර වැඩපිළිවෙල සිවිල් සමාජය තුල වඩා විධිමත් බල ගැන්විමක් සිදු කිරිමේ අරමුණින් 2016 මාර්තු 30 දින ශ්‍රී ලංකාව සඳහා යෝජිත නීති ආධාර ප්‍රතිපත්තිය නමින් ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් ඉදිරි පියවර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් මෙතෙක් ලබා දී නොමැත. | අවශ්‍ය උපදෙස් ලබාගෙන නීති ආධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුවීම. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලයේ අනුමත නිලධාරීන් සංඛ්‍යාව 360 ක් වු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 285 ක්වු හෙයින් සමස්ථ කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 75 ක් විය. මින් තනතුරු 16 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු විය. | පුරප්පාඩු, නව මධ්‍යස්ථාන ආරම්භ කල පසු ක්‍රියාත්මක කරනු ලැබේ. | සේවා අවශ්‍යතා අනුව පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නීති ආධාර කොමිෂන් සභා කාර්යාල පිහිටා තිබෙන බොහොමයක් අධිකරණ බල ප්‍රදේශවල අධිකරණ එකකට වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පවතී. නීති ආධාර මධ්‍යස්ථාන 60 ක් අතරින් මධ්‍යස්ථාන 40 කම එක් නීති නිලධාරියෙකු බැගින් පමණක් සේවයේ නිරත වීම සහ ඔවුන් ඇතැම් අවස්ථාවලදී වෙනත් අධිකරණ බල ප්‍රදේශවලට යාමට සිදුව තිබූ බැවින් කාර්යාල කටයුතු හොඳින් පවත්වාගෙන යාම සඳහා තව දුරටත් නීති නිලධාරීන්ගේ සේවා අවශ්‍යතාවයක් පැවතුණි. | අපට ලැබෙන ප්‍රතිපාදන අනුව සෑම මධ්‍යස්ථානයට නීති නිලධාරී වැඩි ගණනක් ගැනීමට නොහැක. නඩු අනුව නිලධාරී සංඛ්‍යාව වැඩි කිරීමට උත්සාහ කරනු ලැබේ. | කාර්යාලයේ පරිපාලන කටයුතු වලටද බාධාවක් නොවන පරිදි නිලධාරින් බඳවා ගැනීමට සැලසුම් කළ යුතුය. |